**කළුතර අධ්‍යාපන කලාපය**

**දෙවන වාර ඇගයීම - 2018**

| | | |
|---|---|---|
| **10 ශ්‍රේණිය** | **ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය - I පත්‍රය** | **කාලය පැය එකයි** |

**සැලකිය යුතුයි:**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

---

01.සුනාමි ව්‍යසනය නිසා ජලජ ජීව සම්පත් කර්මාන්තයේ දායකත්වය අඩුවූ වර්ෂය වන්නේ,
(1) 1990 වර්ෂය. (2) 1995 වර්ෂය. (3) 2000 වර්ෂය. (4) 2005 වර්ෂය.

02.ජලජ ජීව සම්පත් කර්මාන්තයේ වක්‍ර රැකියා අවස්ථාවකට උදාහරණයක් වන්නේ,
(1) ජලජ පැළෑටි වගාව. (2) බෝට්ටු හා දැල් නිෂ්පාදනය.
(3) විසිතුරු මසුන් ඇති කිරීම. (4) ඉස්සන් වගාව.

03.ශ්‍රී ලංකාවට ප්‍රධාන වශයෙන් උම්බලකඩ සහ හාල්මැස්සන් අපනයනය කරන රට අනුපිළිවෙළින් දැක්වෙන්නේ,
(1) තායිලන්තය සහ ඉන්දුනීසියාව. (2) ඉන්දුනීසියාව හා මාලදිවයින.
(3) මාලදිවයින හා ඉන්දුනීසියාව. (4) තායිලන්තය හා මාලදිවයින.

04.අභ්‍යන්තර ජලජ සම්පත් කර්මාන්තයට හඳුන්වා දී ඇති මත්ස්‍යයන් වන්නේ,
(1) තිලාපියා. (2) මඩ කරියා. (3) කාපි. (4) ඒන්ජල්.

05.වෙරළේ සිට කිලෝමීටර් 100 ට වැඩි ප්‍රදේශ හඳුන්වන්නේ,
(1) මහාද්වීපක තටාකය ලෙසය. (2) ගැඹුරු මුහුද ලෙසය.
(3) දියඹ කලාපය ලෙසය. (4) අත්වෙරළ කළාපය ලෙසය.

06.වැලි වැටි මගින් ඇවුරුද්දේ වැඩි කාලයක් මුහුදින් වෙන් වී ඇති ලවණ ජලය හඳුන්වන්නේ,
(1) කලපු ලෙසය. (2) මෝය ලෙසය.
(3) ද්‍රෝණි ලෙසය. (4) බෝක්කු ලෙසය.

07.කඩොලාන ශාකවල වායුධර මුල් මගින්,
(1) උත්ස්වේදනය අඩු කරයි. (2) ජලයේ ලවණ පිට කරයි.
(3) ජල සංරක්ෂණයට උපකාරීවේ. (4) ශ්වසනයට ඔක්සිජන් ලබා ගනී.

08.අපනයනය තහනම් කර ඇති ඒක දේශීක මත්ස්‍යයෙක් වන්නේ,
(1) බුලත් හපයා. (2) හල් මල් දණ්ඩයා.
(3) හුංගා. (4) තිත්තය.

09.විවිධ ප්‍රයෝජන සඳහා බ්‍රිතාන්‍යය, ජාවා සහ ඉන්දියාව යන රට වලින් මෙරටට හඳුන්වා දුන් මත්ස්‍යයන් අනුපිළිවෙළින් දක්වා ඇත්තේ,

(1) ට්‍රවුට්, තිලාපියා හා ගුරාමි.
(2) යෝද ගුරාමි, තණකොළ කාපය හා ඉන්දියන් කාපය.
(3) ට්‍රවුට්, යෝධ ගුරාමි හා ඉන්දියන් කාපය.
(4) තිලාපියා, යෝධ ගුරාමි හා ට්‍රවුට්.

10.මිරිදිය විසිතුරු ශාක සම්පතක් වන්නේ,
(1) ලුණුවිල. (2) ජපන් ජබර. (3) කෙකෙටිය. (4) කැබොම්බා.

පහත දක්වා ඇති නගර ඇසුරිනි 11 සිට 13 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A – හඳපාන
B – හම්බන්තොට
C – හික්කඩුව
D – මඩකළපුව

11.ජාත්‍යන්තර ප්‍රසිද්ධයට පත් කොරල් පර පිහිටා ඇත්තේ,
(1) A හි. (2) B හි. (3) C හි. (4) D හි.

12.විල්ලු ආශ්‍රිත පරිසර පද්ධතියක් දැකිය හැක්කේ,
(1) A හි. (2) B හි. (3) C හි. (4) D හි.

13.ලවණ වගුරු ආශ්‍රිත පරිසර පද්ධතියක් දැකිය හැක්කේ,
(1) A හි. (2) B හි. (3) C හි. (4) D හි.

14.සාගර තුළ දිය වැල් ජනනය වීමට දායක වන්නේ,
(1) සාගර ජලයේ $O_2$ සාන්ද්‍රනය. (2) මුහුදේ ගැඹුර.
(3) භූමිකම්පා. (4) ග්ලැසියර්.

15. ජල පෘෂ්ඨයට පතිත වන ආලෝකය ගමන් කරන ගැඹුර සීමාව දළ වශයෙන්,
(1) මීටර් 50 කි. (2) මීටර් 100 කි. (3) මීටර් 250 කි. (4) මීටර් 200 කි.

16.ජලජ පරිසරයක ජෛව විවිධත්වය හිතකර pH පරාසය වන්නේ,
(1) 6 - 7 (2) 6 - 7.5 (3) 7 - 8.5 (4) 8.5 වැඩි.

17.ජලය තුලට ආලෝකය සහ $O_2$ වායුව ලැබීම අවහිර කර ජෛව විවිධත්වය හානි ඇති කරන්නේ,
(1) ජපන් ජබර (2) ගඳපාන. (3) මල් අත්තා. (4) මුහුදු තෘණ.

18.ස්භාවික ජෛව විවිධත්වය බලපෑම් ඇති කරන මත්ස්‍ය කාණ්ඩය වන්නේ,
(1) තිලාපියා, ටැංකි සුද්දා. (2) තිලාපියා, ලූලා.
(3) කලපු හඳයා, ලූලා. (4) තිත්තයා, ටැංකි සුද්දා.

19.වෙරළ ආරක්ෂාව සඳහා ඇති ශාකයක් වන්නේ,
(1) වැටකෙයියා. (2) ගඳපාන. (3) දියගෝවා. (4) මල් සියඹලා.

20.වෙරළෙහි ගුල් හාරා ජීවත්වන සතකු වන්නේ,
(1) මටියා. (2) කරාබු ඉස්සා. (3) කැස්බෑවා. (4) කකුළුවා.

21.කාටිලේජ මත්ස්‍යයන්ගේ,

(1) ශරීරය දිගැටි හැඩයක් ගනී. (2) වරල් වල කණ්ඩක ඇත.

(3) කොදු නාරටියක් ඇත. (4) කරමල් පිධානයකින් වැසී නැත.

22.බලයාගේ සමාංශ පුච්ච වරලේ හැඩය වන්නේ,

(1) දෙබිඩි වරල. (2) කවාකාර වරල.

(3) අර්ධ කවාකාර වරල. (4) වටකුරු වරල.

23.කරමල් පෝරු මනාව වැඩී නැති මත්ස්‍යයකු වන්නේ,

(1) හාල්මැස්සා. (2) සලයා. (3) බලයා. (4) පනාවා.

24.ටූනා වර්ගයේ මත්ස්‍යයන්ගේ වේගයෙන් පිහිනීමට ශක්තිය ලබාදෙන්නේ පේශීවල අඩංගු,

(1) නිකොටින්ය. (2) ට්‍රික්සීන්ය.

(3) හිස්ටැමිනය. (4) නයිට්‍රජන් ද්‍රව්‍යය.

25.කරදිය මත්ස්‍යයන්ගේ ආස්‍රැති යාමනය කිරීමට,

(1) සාන්ද්‍ර මුත්‍රා සුළු වශයෙන් පිටකරයි. (2) තනුක මුත්‍රා විශාල වශයෙන් පිටකරයි.

(3) දේහයේ ජල ප්‍රමාණය වැඩි වශයෙන් ඇත. (4) බාහිරින් ශරීරයට ජලය ඇතුළු කරගනී.

26.ඉතා අඩුවෙන් සංචරණය කරන මත්ස්‍යයකු වන්නේ,

(1) බලයා. (2) මඩුවා. (3) ගල් මළුවා. (4) කොස්සා.

27.රාත්‍රී කාලයේදී ජලයෙන් පිටත සිටීමට හැකි මත්ස්‍යයකු වන්නේ,

(1) ලූලා. (2) ආදා. (3) කාවයියා. (4) තිත්තයා.

28.මාංස භක්ෂක මත්ස්‍යයකුගේ,

(1) ආමාශය දිගැටිය. (2) ආමාශය රවුමය.

(3) කුඩා ආමාශයක් ඇත. (4) කෙටි කුඩා අන්ත්‍රයක් ඇත.

29.මත්ස්‍යයන්ගේ නාස් සිදුරු මගින්,

(1) ශ්වසන කරයි. (2) ආඝ්‍රාණය සිදු කරයි.

(3) වැඩිපුර ජලය පිට කරයි. (4) කරමලට ඔක්සිජන් ලබාදේ

30.මත්ස්‍යකුගේ සමාජීය හැසිරීමක් වන්නේ,

(1) එක් රොක් වීම. (2) වේශාන්තරණය.

(3) පර්යටනය. (4) සංක්‍රමණය.

31.ශ්‍රීලංකාවේ විසිතුරු මත්ස්‍යයන් අපනයනය කරන ප්‍රධාන රටක් වන්නේ,

(1) ඉන්දියාව. (2) මාලදිවයින. (3) ජපානය. (4) ඔස්ට්‍රේලියාව.

32. දැල් කූඩු වල ඇති කිරීමට යෝග්‍ය මත්ස්‍ය වර්ග වන්නේ,

(1) ගප්පි. (2) ඒන්ජල්. (3) ජ්ලේටි. (4) කාප්.

33.ඒක දේශික, දේශීය සහ හඳුන්වාදුන් විසිතුරු මත්ස්‍ය කාණ්ඩය නිවැරැදිව දක්වා ඇත්තේ,

(1) ගල් පාන්ඩියා, පතිරණ සාලයා සහ තඹලයා.

(2) බුලත් හපයා, ගල් පාන්ඩියා සහ ගප්පි.

(3) තඹලයා, ගප්පි සහ ගුරාමි.

(4) බුලත් හපයා, තඹලයා සහ ගුරාමි.

34.බිත්තර විසුරවන මත්ස්‍ය වර්ගයක් වන්නේ,

(1) ගෝල්ඩ් ෆිෂ්. (2) ඒන්ජල්. (3) ගුරාමි. (4) ෆයිටර්.

35.පැටවු බිහිකරන මත්ස්‍යයකු වන්නේ,

(1) ෆයර් මසුන්. (2) කාප්. (3) ගප්පි. (4) සීබ්‍රා.

36.විසිතුරු මත්ස්‍ය ආහාර සලාකයක ප්‍රෝටීන ලබා දීමට ඇතුළත් කල හැක්කේ,

(1) හාල් නිවුඩු. (2) තිරිඟු පිටි. (3) බඩ ඉරුගු. (4) සෝයා.

37.ලිංගිකව පරිනත ගැහැනු මත්ස්‍යයකුගේ ලක්ෂණයක් වන්නේ,

(1) උදරය හැකිලී ඇත. (2) උදරය සනවී ඇත.

(3) ප්‍රජනක විවරය රතු පැහැක් ගනී. (4) ළය වරල් හා හිස රළුය.

38.මත්ස්‍ය ටැංකියක ජලය හුවමාරු කිරීමේදී ඉවත් කළයුතු ජල ප්‍රමාණය වන්නේ,

(1) ½ කි. (2) ⅓ කි. (3) ¼ කි. (4) ⅕ කි.

39.මත්ස්‍යකුගේ ප්‍රවේණි සාධක නිසා ඇතිවන රෝගි තත්ත්වයක් වන්නේ,

(1) කොඳු ඇට පෙළ ඇදවීම. (2) කොරල ඉලිප්පීම.

(3) වරල් කුණු වීම. (4) වාතාශ්‍රය ඉදිමීම.

40.මසුන් ප්‍රවාහනය සඳහා සුදුසු උෂ්ණත්වය වන්නේ,

(1) 16 $C^0$ (2) 20 $C^0$ (3) 24 $C^0$ (4) 28 $C^0$

කළුතර අධ්‍යාපන කළාපය

දෙවන වාර ඇගයීම - 2018

| 10 ශ්‍රේණිය | ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය - II පත්‍රය | කාලය පැය දෙකයි |
|---|---|---|

**සැලකිය යුතුයි:**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

01. A. ස්වයං රැකියාවක් ලෙස විසිතුරු මත්ස්‍ය වගාව යොදාගත හැකිය.

i. විසිතුරු මත්ස්‍ය වගාවේ වැදගත් කම් දෙකක් සඳහන් කරන්න. ල-2

ii. a. විසිතුරු මසුන් අපනයනය කරන ප්‍රධාන රටවල් දෙකක් සඳහන් කරන්න. (½ x 2) ල-1

b. ඒක දේශික විසිතුරු මසුන් දෙදෙනෙකු නම් කරන්න. (½ x 2) ල-1


iii. විසිතුරු මසුන් ඇති කිරීමට යොදාගත හැකි ව්‍යුහ හතරක් නම් කරන්න. (½ x 4) ල-2

iv. අභිජනනය සඳහා තෝරා ගන්නා නිරෝගී මත්ස්‍යයකුගේ ලක්ෂණ හතරක් ලියන්න. ල-2

v. විසිතුරු මත්ස්‍ය අභිජනනයේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න. ල-2

vi. මත්ස්‍ය වගාවක ජලය වාතනය කිරීමට ගන්නා ව්‍යුහ දෙකක් නම් කරන්න. ල-2

B. ඉහත දක්වා ඇත්තේ දර්ශීය මත්ස්‍යයකුගේ ශරීරයේ බාහිර ලක්ෂණය.




i. පහත සඳහන් කොටස් නම් කරන්න.

A –

B –

C –

E – (½ x 4) ල-2

ii. පහත සඳහන් අක්ෂර වලින් දක්වා ඇති කොටස් වලින් ඉටුවන කාර්යය සඳහන් කරන්න.

D –

F –

G –

H – (1 x 4) ල-4

iii. E හි වැදගත් කම් දෙකක් සඳහන් කරන්න. ල-2

02. ජලජ ජීව සම්පත් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඉමහත් සේවයක් ඉටුකරයි.

i. ජලජ ජීව සම්පත් ආශිත කාර්මාන්ත තුනක් නිදසුන් සහිතව දක්වන්න. ල-2
ii. ජලජ ජීව සම්පත් කාර්මාන්තය දේශීය ආර්ථිකයට ලබා දෙන සේවාවන් දෙකක් සඳහන් කරන්න. ල-2
iii. ජලජ ජීව සම්පත් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති විභව තුනක් සඳහන් කරන්න. ල-3
iv. ජලජ ජීව සම්පත් කර්මාන්තයේ නව ප්‍රවණතා දෙකක් සඳහන් කරන්න. ල-3

03. කිවුල් දිය පරිසර පද්ධතියක විවිධ ආර්ථිකමය වටිනාකමක් ඇති ජෛව සම්පත් දැකිය හැකිය.

i. කිවුල් දිය සත්ව සම්පත් දෙකක් සඳහන් කරන්න. ල-2
ii. කිවුල් දිය පරිසරයක ඇති කඩොලාන ශාක දෙකක් සඳහන් කරන්න. ල-2
iii. පහත සඳහන් කඩොලාන ලක්ෂණ වලට හේතුව බැගින් දක්වන්න. ල-3

| කඩොලාන ලක්ෂණ | හේතුව |
|---|---|
| 01.පත්‍ර කුඩා වීම.<br>02.දණ හිස් මුල් පැවතීම.<br>03.වායු ධර මුල් පැවතීම. | |

iv. කඩොලාන වලින් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න. ල-3

04.ජලය ආශ්‍රිත පරිසරයත් එහි වෙසෙන ජෛව ප්‍රජාවත් එක්ව සැදුම් ලත් පරිසර පද්ධතිය ජලජ පරිසර පද්ධතියක් ලෙස හඳුන්වයි.

i. ස්වභාවික ජලජ පරිසර පද්ධතියක් වර්ග කර දක්වන්න. ල-3
ii. ශ්‍රී ලංකාවේ දැකිය හැකි පර පද්ධති තුනක් සඳහන් කරන්න. ල-3
iii. මුහුදු තෘණ පරිසරයක දැකිය හැකි පෘෂ්ඨ වංශික සත්වයන් දෙදෙනකු නම් කරන්න. ල-2
iv. මුහුදු තෘණ ආශ්‍රිත පරිසර පද්ධතියක ඇති වැදගත් කම් දෙකක් සඳහන් කරන්න. ල-2

05.ජලජ පරිසර පද්ධතිවල ජෛව විවිධත්වය වර්ධනයට විවිධ සංසිද්ධීන් දායකවේ.

i. ජෛව විවිධත්වය බලපාන ස්වභාවික සංසිද්ධි තුනක් සඳහන් කරන්න. ල-3
ii. ජලජ පරිසරය විනාශ වීමට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න. ල-3
iii. මෝසම් සුළං සහ වර්ෂාව මගින් ජලයේ සිදුවන ගුණාත්මක වෙනස් කම් දෙකක් නම් කරන්න. ල-2
iv. ජලය තුළ ආලෝකය ගමන් කරන සීමාව වෙනස් වීමට හේතුවන කරුණු දෙකක් ලියන්න. ල-2

06.ආහාරමය මිරිදිය මත්ස්‍ය වගාව, අද ශ්‍රී ලංකාව තුල ප්‍රචලිත කර්මාන්තයකි.

i. ආහාරමය මිරිදිය මත්ස්‍ය වගාවක වැදගත්කම් දෙකක් සඳහන් කරන්න. ල-2
ii. මිරිදිය මසුන් පොකුණක් තුල වගා කල හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න. ල-2
iii. ශ්‍රී ලංකාවේ ජලාශවල සිටින දේශීය මත්ස්‍ය විශේෂ ව්‍යාප්ත කිරීමට නොහැකි වීමට හේතු තුනක් ලියන්න. ල-3
iv. ආහාරමය මිරිදිය මසුන්ගේ දැකිය හැකි විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. ල-3

07.මත්ස්‍යයන්ගේ සාමාජ හා පාරිසරික අනුවර්තන මත්ස්‍ය සම්පත් තිරසාර සංවර්ධනයට වැදගත් වේ.

i. බිත්තර හා පැටවුන් රැකබලා ගැනීම සඳහා මසුන් තුළ දැකිය හැකි හැසිරීම් රටා දෙකක් සඳහන් කරන්න. ල-2
ii. මත්ස්‍යයන් තම පැවැත්ම තහවුරු කරගැනීමට ගන්නා අනුවර්තන දෙකක් සඳහන් කරන්න. ල-2
iii. මත්ස්‍යයන් රංචු වශයෙන් පිහිනීමේ ඇති වැදගත් කම් තුනක් සඳහන් කරන්න. ල-3
iv. මත්ස්‍යයන් ආකර්ශණය වන ප්‍රභව තුනක් සඳහන් කරන්න. ල-3